ඇතුළත් විය. රාජ්‍ය අංශයේ බැංකු වලට ග්‍රාමීය ණය කටයුතු වලින් සාධාරණ ලාභ මට්ටමක් ලබා ගැනීම සඳහා උපකාරී විය හැකි ක්‍රම පිළිබඳව ද ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය විසින් සලකා බලන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීම සඳහා නීති කෙටුම්පත් සම්පාදනය කිරීමේ කටයුතු වර්ෂයේ අග භාගය තුළදී කරගෙන යන ලදී.

මෙම වාර්ෂික වාර්තාවේ වෙනත් ස්ථානයක සවිස්තරව දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර සහ අනුරාධපුර ශාඛාවන් විසින් ග්‍රාමීය ප්‍රදේශවල ස්වයං රැකියා වර්ධනය කිරීම සහ ග්‍රාමීය ආර්ථිකයේ වර්ධනය සහ සංවර්ධනය සහතික කිරීමේ අරමුණින් ඒවායේ විශේෂ ග්‍රාමීය ණය සැපයීමේ වැඩපිළිවෙල වඩා පුළුල් පරිමාණයෙන් නොකඩවා කරගෙන යනු ලැබීය.

## කර්මාන්ත[1]

වර්තන වටිනාකම් අනුව, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී කර්මාන්ත අංශයේ වර්ධනය සියයට 10 ක් ලෙස වාර්තා වී ඇත. මූර්ත වටිනාකම් අනුව කාර්මික නිමැවුම සියයට 2 කින් වර්ධනය වූ බවට ඇස්තමේන්තු කර තිබේ. 1983 වර්ෂය තුළදී කාර්මික නිෂ්පාදන අනුපාතයේ වේගයෙහි අඩුවීමක් තිබූ බව සඳහන් කළ යුතු වේ. පසුගිය අවුරුදුවලදී වර්ධනයේ වේගය අඩු වුවද මෙම අංශය අපනයනාභිමුඛ සංවර්ධන උපාය මාර්ගයේ ක්‍රියාශීලී කොටසක් ඉටු කළේය. ඉදිරි වර්ෂවල දිවයිනේ ආර්ථික වර්ධනය සහ සංවර්ධනය පිළිබඳව සැලකිය යුතු බලපෑමක් සහතික කෙරෙන ආයෝජකයන් ඇදගැනීමේ කර්තව්‍යය, මෙම අංශය මගින් විවිධ දිරිගැන්වීම් යටතේ නොකඩවා කරගෙන යනු ලබයි. අපනයන ඉපැයුම්වලට මෙම අංශයේ ඇති දයකත්වය 1978 සියයට 14 සිට 1983 දී සියයට 35 දක්වා වැඩිවිය. මෙමගින් ආර්ථිකයේ ව්‍යුහාත්මක ස්වරූපයේ වෙනසක් හැඟවෙයි. කෙසේ වුවද, මෙම කරුණ තේරුම්ගත යුත්තේ දේශීය එකතුකළ අගයේ වටිනාකම සාපේක්ෂ වශයෙන් පහත් මට්ටමක පවතින ඇඟලුම් සහ ඛනිජ තෙල් නිෂ්පාදිතවල ඇති වූ කාර්මික අපනයන වර්ධනය සඳහා ඉඩහැරීමෙන් අනතුරුවයි.

1983 වර්ෂයේ වර්ධන වේගයේ මෙම අඩුවීමට රාජ්‍ය අංශයේ සංස්ථාවල නිමැවුමේ අඩු-වීම විශාල ලෙස බලපාන ලදී. දළ වටිනාකම් අනුව, කාර්මික නිෂ්පාදිතයෙහි ඉහළ බරතැබීම-කට හිමිකම් කියන ඛනිජ තෙල් පිරිපහදුව 1983 වර්ෂයේ මුලදී සති අටක කාලයක් තුළ වසා තැබීම එහි නිමැවුම සියයට 21 කින් පහත වැටීමට හේතු විය. රාජ්‍ය අංශයේ කර්මාන්තවල මුල් බැසගත් ඌණ උපයෝගීකරණ ප්‍රශ්නය, 1983 වර්ෂයේදී වඩාත් නරක අතට හැරුනේ කාර්මික නිෂ්පාදිතය මත බරපතල බලපෑම් ඇති කරමිනි. එම සංස්ථාවල පාලනයෙන් පරි-බාහිර හේතූන් වූ විදුලිබලය කපාහැරීම් සහ ජූලි කලබල සමයේදී වැඩ කරන පැය ගණන අඩු කිරීම මීට අර්ධ වශයෙන් බලපෑවේය. කෙසේ වෙතත් පෞද්ගලික අංශයේ වර්ධනය ප්‍රසංශනීය එකක් විය. එමගින් රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිෂ්පාදනයේ අඩුවීම සමනය වීමටද බල-පෑමක් ඇතිවිය.

1. පසුගිය වර්ෂවලදී මෙන්ම 1983 වර්ෂයේදීද කර්මාන්ත අංශයේ ප්‍රගතිය පිළිබඳ දත්තයන් පදනම් කොටගත්තේ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි ලොකු, මධ්‍යම සහ කුඩා සියළුම වාර්තාගත සහ ප්‍රසිද්ධ නිමැවුම් කර්-මාන්තයන් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව මගින් යවන ලද ප්‍රශ්නාවලියකට ලැබුණු පිළිතුරුයි. (කෙසේ වුවද, ජාතික ආදයම ගණනය කිරීමේදී, කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියක් ලෙස වර්ග කරනු ලබන වැවිලි කර්මාන්-තයට සම්බන්ධ අපනයන සැකසුම් කටයුතු මීට ඇතුළත් කර නැත). පොදුවේ ගත් කල ආමන්ත්‍රිත ආයතනයන්ගෙන් තුනෙන් පංගුවකින් පමණ පිළිතුරු ලැබුණ අතර ඒවායින් ප්‍රධාන කර්මාන්ත සියල්ලම පාහේ නියෝජනය විය. දත්තයන් ලබාගත නොහැකි වූ අංශයන් පිළිබඳව විවිධ රාජ්‍ය ආයතනයන් හා සංවිධානයන්ගෙන් ලබාගත හැකිවූ තොරතුරු පදනම්කොට කැරුනු ඇස්තමේන්තු ප්‍රයෝජනයට ගනු ලැබිණ.

කර්මාන්ත අංශයේ ප්‍රශ්න තවදුරටත් තීව්‍ර කරන ලද්දේ 1983 ජුලි හා අගෝස්තු මාසවල ජාතිවාදී කලබල හේතුවෙන් පැනනැගුණු තත්ත්වය මගිනි. කර්මාන්තවලට සහ වාණිජමය ආයතනවලට සිදුවූ අලාභ හානි සම්බන්ධව රජය මගින් පත්කරනු ලැබූ වැඩ බලමුළුවට අනුව, කාර්මික ආයතන 122 ක් අලාභ හානිවලට ලක්ව ඇති අතර, සේවකයින් 13,666 දෙනෙකු රැකියා විරහිත තත්ත්වයට පත්ව ඇත. නිෂ්පාදිත කාණ්ඩ 18 ක් අලාභ හානිවලට භාජනය වී ඇති බවට හඳුනාගෙන ඇති අතර රෙදිපිළි හා ඇඳුම් පැළඳුම් අංශය මගින් දරන ලද අලාභ හානි සාපේක්ෂ වශයෙන් විශාලය. රෙදිපිළි ගණයට අයත් කාර්මික ආයතන 43 කට අලාභ හානි සිදුවී ඇති බවට වාර්තා වී තිබේ. ආහාරපාන වර්ග සහ දුම්කොළ ගණයේ ආයතන 20 ක් ද, රසායනික ද්‍රව්‍ය සහ ප්ලාස්ටික් නිෂ්පාදිත ගණයේ ආයතන 21 ක් ද, සකස් කළ ලෝහ නිෂ්පාදිත ගණයේ ආයතන 16ක් ද, අලාභ හානිවලට ලක්ව ඇති බවට වාර්තා වී ඇත. අලාභ හානිවලට මුහුණ දුන් කාර්මික ආයතන අතුරින් 32 ක් ඉදිරි මාස 12 ක කාලය තුළදී සපුරාලිය යුතු රුපියල් දශ ලක්ෂ 800 ක් වටිනා අපනයන ඇණවුම් ලබා තිබුණි. මෙම කර්මාන්ත යළිත් කලින් තිබුණු තත්ත්වයට පත් කිරීමේ පිරිවැය රුපියල් දශ ලක්ෂ 1,750 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. අලාභ හානිවලට භාජනය වූ කර්මාන්තයටම අයත්, එහෙත් එවැනි බලපෑමකට ලක් නොවූ ආයතනයන්හි පැවති උපයෝජනය නොවූ ධාරිතාවයන් මගින්, නිෂ්පාදනයේ ඇතිවූ අඩුව මග හැරුණු නිසා සමස්ත කාර්මික නිෂ්පාදනය මත කලබල මගින් ඇතිකරන ලද බලපෑම පිළිබඳ තක්සේරුව දුෂ්කර විය. තවද, වැඩියෙන්ම බලපෑමට ලක්වූ අංශය වූ රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් නිෂ්පාදනය විමර්ශනයට භාජනය වන වර්ෂය තුළදී නිෂ්පාදනයෙහි ඉහලම වර්ධනය වාර්තා කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ සමීක්ෂණයට අනුව, 1983 වර්ෂය අවසාන වනවිට අලාභ හානිවලට ලක්වූ ආයතනවලින් සියයට 10 ක් නැවත නිෂ්පාදන කටයුතු අරඹා තිබුණු අතර, සියයට 16 ක් යළි නගාසිටුවීමේ කටයුතු කරගෙන යමින් සිටියහ.

රාජ්‍ය අංශයේ ව්‍යාපෘතීන් කිහිපයක විශාල අලාභ ලැබීම් තවදුරටත් පැවතියෙන් ඒවායේ නිෂ්පාදන කටයුතු වර්ෂය තුළදී තාවකාලිකව අත්හිටුවනු ලැබීය. මෙම කාණ්ඩය තුළ අන්තර්ගත වූ යෝධ ව්‍යාපෘතීන් වූයේ, ප්‍රාග්ධන ආයෝජන රුපියල් දශ ලක්ෂ 750 ක් ඇතුළත් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නයිලෝන් 6 ව්‍යාපෘතියත්, ප්‍රාග්ධන ආයෝජන රුපියල් දශ ලක්ෂ 207 ක් ඇතුළත් වානේ සංස්ථාවේ දෙවන අදියරත් සහ ප්‍රාග්ධන ආයෝජන රුපියල් දශ ලක්ෂ 2,819 ක් ඇතුළත් රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ යූරියා ව්‍යාපෘතියත්ය. ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශයන්හිද ඇතිවූ වෙනස්වීම් කරණකොටගෙන මෙම ව්‍යවසායයන්හි ක්‍රියාකාරිත්වය අලාභදායී බවට පත්ව ඇත. මෙම ව්‍යවසායයන් හා සම්බන්ධ ඉහළ ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණයන් සහ විශාල සේවා නියුක්ති ප්‍රමාණය හේතුවෙන් එම කම්හල් ස්ථිරවම වසා දැමීම රජයට ගැනීමට සිදුවන දුෂ්කර දේශපාලන තීරණයක් වනු ඇත. එසේ වුවද, මෙම ව්‍යාපෘතීන් නුදුරු අනාගතයේදී කිසියම් ආර්ථිකමය ඵලදායීතාවයක් සහ වාණිජමය හැකියාවක් පෙන්නුම් නොකරන්නේ නම් ඒවා සහනාධාර සැපයීම මගින් තවදුරටත් පවත්වාගෙන යාමේ සාධාරණීකරණයක් නොමැත.

1977 සිදුවූ ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවේ ආනයන බදු ව්‍යුහය ප්‍රතිශෝධනය කරන ලද්දේ තරඟකාරී ආනයන වෙතින් දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමේ මූලික උපකරණය වශයෙන් තීරුබදු මත විශ්වාසය තබමිනි. කෙසේ වුවද, නව තීරු බදු ක්‍රමය පූර්ණ විමර්ශනයකට ලක්ව නැති නිසා එය සමහර ක්‍රියාකාරකම්වලට ඉහළ ආරක්ෂණයක්ද සමහර ක්‍රියාකාරකම්වලට පහළ ආරක්ෂණයක් ද සහිතව වරණාත්මක වෙනසක් ප්‍රතිඵල වශයෙන් ඇතිකර තිබේ. 1979–1983 අතර කාලයේදී තීරුබදු ව්‍යුහය තුළට වෙනස්කම් කීපයක් හඳුන්වා දෙනු ලැබූ නමුත්, ඒවා 1977 දී ප්‍රකාශයට පත් කරනු ලැබූ ආර්ථික ප්‍රතිපත්තිවල පරමාර්ථයට මුළුමනින්ම අනුකූල වූ තීරුබදු ව්‍යුහයක් කරා වූ කිසිම යොමුවීමක් නොපෙන්වීය. සමහර තීරුබදු වෙනස්කම් නිෂ්පාදකයින්ගේ ඉල්ලීම් මත කරන ලද ආරක්ෂණකාරී පිළිවෙත් වූ අතර තවත් සමහරක් ආදායම් පිළිබඳ සලකා බැලීම මගින් පොළඹවනු ලැබූ ඒවා විය. ආදායම් පරමාර්ථ කරගත් ආනයන බදු 1983 දී සියයට 2.5 මට්ටමේ සිට සියයට 10 දක්වා වූ

පරාසයක් තුළ ඉහළ නංවන ලදී. සඵල ආරක්ෂණ මට්ටම පිළිබඳ සැළකිල්ලට නොගන්නා මේ ආකාරයේ ප්‍රතිශෝධන උපකාරී වන්නේ අව්චාරවත් තීරුබදු ව්‍යුහයක නොනවත්වා පවත්වාගෙන යාමට පමණි. ජනාධිපති තීරුබදු කොමිෂමේ කර්තව්‍යය වන්නේ, ඵලදායී ආරක්ෂණ මට්ටම් සහ සේවා නියුක්ති ඉඩප්‍රස්ථා වැඩිකිරීම ඇතුළත් රජයේ සමාජ සහ ආර්ථික ප්‍රමුඛතා පිළිබඳ අවධානය යොමු කරමින් තර්කාන්විත තීරුබදු ව්‍යුහයක් සකස් කිරීමයි. ශ්‍රී ලංකාව සඳහා තර්කාන්විත තීරුබදු ව්‍යුහයක් සකස් කිරීමේ වැදගත්කම අධිඅවධාරණයකට ලක්කළ නොහැක. අවසානයේදී ජාත්‍යන්තර වෙළඳපලේ ඵලදායී ලෙස තරග කළ හැකි කාර්‍යක්ෂම නිෂ්පාදන අංශයක් ගොඩනැගීම රාජ්‍ය ප්‍රතිපත්තියේ අභිප්‍රාය වීම මීට හේතුවයි.

විදේශ ආයෝජන උපදේශක කමිටුව (වි. ආ. උ. ක.) 1983 දී කාර්මික ව්‍යාපෘතීන් 56 ක් අනුමත කර ඇති අතර, ඒවායේ අපේක්ෂිත ආයෝජනය රුපියල් දශ ලක්ෂ 1,030 ක් ද ඇති වේයයි බලාපොරොත්තුවන සේවා නියුක්ති මට්ටම 8,914 ක්ද වේ. 1983 ජුනි අවසානය වන විට, පුද්ගලයින් 18,974 දෙනෙකුට සේවා ඉඩප්‍රස්ථා සලසමින් ව්‍යාපෘතීන් 114 ක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි. මෙම ව්‍යාපෘතීන්හි විදේශීය හා දේශීය ආයෝජනය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 462 ක් සහ රුපියල් දශ ලක්ෂ 1,021 ක් විය. නිෂ්පාදන කටයුතුවල නියැලී සිටින මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාවෙන් 43 ක් රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් අංශයට අයත් වන අතර ඒවායේ සේවයේ යෙදී සිටි පුද්ගලයින්ගේ ගණන 13,757 ක් විය. රසායනික හා රසායනික නිෂ්පාදිත ප්ලාස්ටික් හා රබර් මූලික කර්මාන්තවල නියැලුණු ව්‍යාපෘතීන් සංඛ්‍යාව 29 ක් වූ අතර එමගින් පුද්ගලයින් 1,773 කට රැකියා ඉඩ ප්‍රස්ථා සැලසී ඇත.

කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය, පේෂකර්මාන්ත අමාත්‍යාංශය සහ ධීවර අමාත්‍යාංශය හා අනුයුක්ත දේශීය ආයෝජන උපදේශක කමිටු මගින් කාර්මික ව්‍යාපෘතීන් 346 ක් වර්ෂය තුළදී අනුමත කර ඇත. මෙම ව්‍යාපෘතීන්හි අපේක්ෂිත ආයෝජනය රුපියල් දශ ලක්ෂ 415 ක් වන අතර ඒවා මගින් ආසන්න වශයෙන් පුද්ගලයින් 9,894 දෙනෙකුට රැකියා සැපයේ යැයි අපේක්ෂිතයි.

1983 වර්ෂයේදී මහ කොළඹ ආර්ථික කොමිසම (ම. කො. ආ. කො.) ව්‍යාපෘතීන් 15 ක් අනුමත කර ඇත. මේ අනුව අනුමත කරන ලද මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාව වර්ෂය අවසානය වනවිට 185 දක්වා වැඩි විය. මේවායින් 99 ක් විවිධ කර්මාන්ත ඇරඹීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම සමග ගිවිසුම්වලට එළඹ ඇත. ඒ අතරින් ව්‍යාපෘතීන් 66 ක් වාණිජමය නිෂ්පාදන කටයුතුවල යෙදී සිටි අතර සැපයුණු සේවා නියුක්ති ප්‍රමාණය 26,053 ක් විය.

පෙබරවාරි/මාර්තු මාසවලදී පිරිපහදුව වසා තැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලබාගතහැකි අපනයන අතිරික්තය අඩුවීම ප්‍රධාන හේතුව කරගෙන, කාර්මික අපනයන ක්ෂේත්‍රයේ පහත වැටීමක් දක්නට ලැබුණි. ගෘහස්ත පොහොර නිෂ්පාදනය කරා නැප්තා යොමු කරනු ලැබීමද මෙම අඩුවීමට දයක වූ සාධකයක් විය. සෙසු කාර්මික අපනයනයන් සියයට 23 කින් එනම් 1982 දී රුපියල් දශ ලක්ෂ 4,991 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 6,139 දක්වා ඉහළ ගියේය. ඛනිජ තෙල් නිෂ්පාදිත ඇතුළත් කාර්මික අපනයනයන්, රුපියල් වටිනාකම් අනුව බලන්කල 1982 දී රුපියල් දශ ලක්ෂ 8,271 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 8,821 දක්වා සියයට 7 කින් ඉහළ ගියද විගැහි වටිනාකම් අනුව ඒවායේ අගය සියයට 3 කින් පහත වැටුණි.

**නිෂ්පාදනය**

1982 වර්ෂයේ සියයට 9 ක සැළකිය යුතු වර්ධන අනුපාතයට සාපේක්ෂව 1983 වර්ෂයේ සමස්ත කාර්මික නිමැවුම සියයට 2 කින් වැඩිවූ බවට ඇස්තමේන්තු කර ඇත. මෙයට ප්‍රධාන හේතුව පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි සියයට 26 ක වර්ධනය හා රාජ්‍ය අංශයේ සියයට 15 ක ඍණ වර්ධනයයි. 1983 රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමේ ඍණ වර්ධන අනුපාතයට

ප්‍රධාන හේතුව වූයේ ඛනිජ තෙල් සහ රසායනික නිෂ්පාදනයන්හි නිමැවුමේ සියයට 21 ක පහත වැටීමයි. ඛනිජ තෙල් සංස්ථාවේ නිමැවුම හැර රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සමස්ත කාර්මික නිෂ්පාදනය සියයට 7 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

මූර්ත වශයෙන් නිෂ්පාදනයේ වැඩි වීමක් වාර්තා කර ඇති අංශයන් වූයේ අපනයනාභිමුඛ ඇඟළුම් කර්මාන්ත විශේෂයෙන් ආයෝජන ප්‍රවර්ධන කලාපයේ කර්මාන්තයන් ඇතුළු රෙදිපිළි ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදිත (සියයට 34 කින්), ආහාර, පානවර්ග හා දුම්කොළ නිෂ්පාදිත (සියයට 11 කින්), සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 6 කින්), දැව හා දැව නිෂ්පාදිත (සියයට 8 කින්), මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 6 කින්), කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 2 කින්), අන්තැනෙක සඳහන් නොකළ අනෙකුත් නිෂ්පාදිත (සියයට 11 කින්) මූර්ත වශයෙන් නිෂ්පාදනය වැඩිවීමක් වාර්තා කළ අංශයන් විය. අනෙක් අතට ඛනිජ තෙල් හා රසායනික නිෂ්පාදිත නිමැවුම සියයට 18 කින් ද, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සියයට 3 කින් ද පහත වැටුණි. කඩදාසි නිෂ්පාදිත හැර, පෞද්ගලික අංශයේ සැම නිෂ්පාදන අංශයකම ඉහළ නිමැවුම් මට්ටම් වාර්තා කළේය.

වර්තන මිළ අනුව කාර්මික නිෂ්පාදනයේ වර්ධන අනුපාතය 1982 වර්ෂයේදී සියයට 13 සිට 1983 වර්ෂයේදී සියයට 10 දක්වා පහත වැටුණි. රසායනික හා ඛනිජ තෙල් නිෂ්පාදිත අංශය හැර 1983 වර්ෂයේ සමස්ත කාර්මික නිෂ්පාදනය සියයට 29 කින් වැඩිවී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. මෙය 1982 වර්ෂයේ සියයට 16 ක වර්ධන අනුපාතය හා සැසඳේ. 1982 ට වඩා 1983 දී දැව හා දැව නිෂ්පාදිත සහ රෙදිපිළි හා ඇඳුම් පැළඳුම් යන අංශ පිළිවෙලින් සියයට 45 ක සහ සියයට 44 ක තියුණු වැඩිවීමක් වාර්තා කළේය. ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත සියයට 33 කින්, සකස් කළ ලෝහ නිෂ්පාදිත සියයට 25 කින්, කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සියයට 24 කින්, මූලික ලෝහ නිෂ්පාදිත සියයට 15 කින් සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සියයට 7 කින් ද වටිනාකම් වැඩි විය. ඛනිජ තෙල් හා රසායනික නිෂ්පාදිතයන්හි නිමැවුම් වටිනාකම සියයට 9 කින් පහත වැටුණි.

**1 . 19 සංඛ්‍යා සටහන**

**කාර්මික නිෂ්පාදන වටිනාකම 1979—1983**

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | 1979 | 1980 | 1981 | 1982 | 1983 (අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 2,856 | 3,899 | 4,496 | 5,246 | 6,998 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 1,128 | 1,923 | 3,040 | 3,863 | 5,136 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 166 | 289 | 315 | 361 | 522 |
| 4. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත .. | 445 | 476 | 626 | 725 | 901 |
| 5. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 4,508 | 9,416 | 12,015 | 13,099 | 11,888 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 710 | 1,156 | 1,250 | 1,370 | 1,468 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 349 | 478 | 428 | 262 | 302 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 569 | 620 | 782 | 904 | 1,129 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) .. | 50 | 54 | 58 | 74 | 90 |
| එකතුව .. | 10,781 | 18,311 | 23,010 | 25,904 | 28,434 |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**බලය සහ ඉන්ධන**

1983 වර්ෂයේදී කර්මාන්තවලට අදළ විදුලිබල භාවිතය පසුගිය වසරට වඩා සියයට 2 කින් ඉහළ ගිය අතර, කාර්මික ඉන්ධන වල දේශීය අලෙවිය සියයට 37 ක වැඩි වීමක් සටහන් කරයි. කෙසේ වුවද, මෙහි දක්වා ඇති කර්මාන්ත අංශයේ විදුලිය භාවිතය ගණනය කිරීමේදී විදුලිය කපා හළ අවස්ථාවලදී ආයතනයන් විසින් ස්වකීය උත්පාදක යන්ත්‍ර මගින් ජනනය කරවන ලද විදුලිය බල උත්පාදනය ඇතුළත් කර නොමැත. කාර්මික ඉන්ධනවල අලෙවියේ සැලකිය යුතු වැඩි වීමට බොහෝසෙයින් හේතු වූයේ ලංකා විදුලි බල මණ්ඩලය විසින් ජල විදුලි බලයට අතිරේකව තාප බල ජනනය සඳහා බැර ඩීසල් පරිභෝජනය වැඩි කිරීමයි.

පසුගිය වසර හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී කුඩා කර්මාන්තයන්හි විදුලිය පරිභෝජනය සියයට 12 කින් වැඩි වූ අතර, මහා පරිමාණ කර්මාන්තයන්හි සියයට 2 ක වැඩි වීමක් වාර්තා කරයි. 1983 දී මධ්‍යම පරිමාණ කර්මාන්තයන්හි විදුලිය පරිභෝජන මට්ටමෙහි සුළු ඉහළ නැගීමක් වාර්තා විය.

**1 . 20 සංඛ්‍යා සටහන**

**කර්මාන්තවල විදුලි බලය හා ඉන්ධන භාවිතය 1981—1983**

| ශීර්ෂය | 1981 | 1982 | 1983 (අ) |
|---|---|---|---|
| 1. විදුලි බලය (ආ) (ගිග වොට් පැය) .. | 676·7 | 739·1 | 752·0 |
| 1·1 කුඩා පරිමාණ කර්මාන්ත .. | 21·3 | 26·0 | 29·0 |
| 1·2 මධ්‍යම පරිමාණ කර්මාන්ත .. | 308·9 | 338·7 | 339·7 |
| 1·3 මහා පරිමාණ කර්මාන්ත .. | 346·5 | 374·3 | 383·3 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය විකුණුම් (මෙට්‍රික් ටොන් දහස් ගණනින්) .. | 350·9 | 412·2 | 565·5 |
| 2·1 බැර ඩීසල් (ඇ) .. | 106·6 | 169·3 | 285·5 |
| 2·2 දුව් තෙල් .. | 244·3 | 242·9 | 280·0 |

මූලයන් : ලංකා විදුලි බල මණ්ඩලය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) තාවකාලික


(ආ) කාර්මික නිෂ්පාදන සහ අපනයන සැකසුම් කර්මාන්තද ඇතුළත්ය. කුඩා පරිමාණ කර්මාන්ත යනු කිලෝවෝල්ට් ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයක් ඇති කර්මාන්ත වන අතර, කිලෝවෝල්ට් ඇම්පියර් 50 - 500 අතර ඒවා මධ්‍යම පරිමාණ කර්මාන්ත වශයෙන්ද, කිලෝවෝල්ට් ඇම්පියර් 500 ට වැඩි ඒවා මහා පරිමාණ කර්මාන්ත වශයෙන් ද සැළකේ.

(ඇ) ලංකා විදුලි බල මණ්ඩලයට කරන ලද විකුණුම් ද ඇතුළත්ය.

**රාජ්‍ය අංශයේ කර්මාන්ත**

පසුගිය වසරේ වූ සියයට 5 ක වර්ධනය හා සැසඳීමේදී, 1983 වර්ෂයේදී රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්හි සමස්ත නිමැවුම, මූර්ත වශයෙන් සියයට 15 කින් පහත වැටුණි. 1983 දී වූ මෙම සමස්ත පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු සාධක වූයේ රාජ්‍ය අංශයේ මුළු කාර්මික නිෂ්පාදනයෙන් අඩක් පමණ නියෝජනය කරන ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ තෙල් පිරිපහදුව නඩත්තු කටයුතු සඳහා 1983 දී සති අටකට ආසන්න කාලයක් වසා තිබීමේ හේතුවෙන් එහි නිමැවුම සියයට 21 කින් සැළකිය යුතු ලෙස පහත වැටීමයි. සමාලෝචිත වසරේදී ඛනිජ තෙල් සංස්ථාව හැර රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්හි මුළු නිමැවුම සියයට 7 ක පහත වැටීමක් දක්විය. මෙයින්, පොහොර නිෂ්පාදන සංස්ථාව ප්‍රධාන වශයෙන් අළුත්වැඩියා කිරීම් සඳහා එහි කර්මාන්ත ශාලාව වසා තැබීම හා නිෂ්පාදන ගැටළු හේතුකොටගෙන සියයට 41 ක නිමැවුමේ පහත වැටීමක් වාර්තා කළේය. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ නිමැවුම් මට්ටමේ පහත වැටීමට (සියයට 9 කින්) වැඩි වශයෙන් හේතු වූයේ, ක්ලින්කර් සැපයුමේ හිඟය නිසා එහි උඳුන් වසා තැබීමයි. රාජ්‍ය ස්කාගාර සංස්ථාව සහ ජාතික කිරි මණ්ඩලය පිළිවෙලින් සියයට 32 ක සහ සියයට 16 ක පහත වැටීම් වාර්තා කළේය.

## රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමවුම් දර්ශකය*




ශ්‍රී ලංකා මහ බැංකුව.

* ප්‍රධාන ව්‍යවසායයන් 26 යේ නිමැවුම් නියෝජනය කරයි.

වසර තුළ පැවති මෙතෙක් නොවූ විරූ නියගයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ යෙදවුම් හිඟය මීට මූලික හේතුවක් විය. ජාතික ලුණු සංස්ථාවේ සහ රාජ්‍ය පතල් කැනීම් හා ඛනිජ සංවර්ධන සංස්ථාවේ නිෂ්පාදනය 1983 දී සියයට 30 කින් පහත වැටුනි. නිමැවුම් මට්ටම්හි වැඩිවීම් වාර්තා කළ සංස්ථා අතර රාජ්‍ය ද්‍රව (සියයට 21), ලංකා තෙල් සහ මේද (සියයට 16) සහ ලංකා ඛනිජ වැලි (සියයට 10) විය.

අලෙවි කටයුතු සම්බන්ධයෙන් ලංකා සම් භාණ්ඩ, රාජ්‍ය පතල් කැනීම් සහ ඛනිජ සංවර්ධන, ලංකා පිඟන් භාණ්ඩ සහ ලංකා තෙල් සහ මේද සංස්ථා 1983 දී මැනැවින් ක්‍රියාත්මක විණ. අනෙක් අතින්, රාජ්‍ය ලෝහ භාණ්ඩ, ලංකා වානේ සහ ලංකා සිමෙන්ති යන සංස්ථාවන්හි අලෙවි කටයුතුවල පහත වැටීම සමාලෝචිත වසර තුළදීද තවදුරටත් පැවතිණි. දැඩි ආරක්ෂණ සලසා තිබියදීත් තුලනාත්මක වාසිදායක බවක් ඇති ටයර්, කෝස්ටික් සෝඩා සහ සීනි වැනි නිෂ්පාදිතයන් සම්බන්ධව පවා ඇතැම් රාජ්‍ය අංශයේ කර්මාන්තයන් විසින් දේශීය ඉල්ලුමට මුහුණ දීමට පැහැදිලිවම අසමත් බවක් පෙන්නුම් කරන ලදී.

**1 . 21 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්තවල නිමැවුම් දර්ශකය**

**(1977 = 100)**

| කාර්මික ගණය | 1981 | 1982 | 1983 (අ) |
|---|---|---|---|
| 1. ආහාර, පානවර්ග සහ දුම්කොළ .. | 80·6 | 83·6 | 73·6 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 118·3 | 135·7 | 127·0 |
| 3. ද්‍රව හා ද්‍රව නිෂ්පාදිත .. .. | 136·4 | 151·0 | 163·1 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. .. | 141·1 | 133·3 | 135·7 |
| 5. රසායන ද්‍රව්‍ය, ඛණිජතෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. .. | 118·9 | 133·1 | 105·2 |
| 6. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත .. | 161·8 | 131·5 | 125·1 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. .. | 169·0 | 106·3 | 109·7 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත .. .. | 82·2 | 96·3 | 76·8 |
| සියළුම කාර්මික ගණයන් | 118·4 | 124·6 | 106·7 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික.

1977 ආර්ථික ප්‍රතිසංස්කරණයන් සහ කලින් පැවති පාලන නීති රීති පිළිබඳ ව්‍යුහය බිඳ දැමීමත් සමග, රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් විසින් එතෙක් භුක්තිවිඳි වරප්‍රසාද නැති කොට ඒවා පෞද්ගලික ව්‍යවසායයන් හා සම තරගකාරී තත්ත්වයකට පත් කරන ලදී. වාණිජමය පදනමක් මත ක්‍රියාත්මක වීමටත්, සංවර්ධන කටයුතු සඳහා අරමුදල් තමන් විසින්ම උපදවා ගැනීමට හෝ තරගකාරී වාණිජමය ණය ගැනීම් මගින් ඉටු කර ගැනීමක් ඒවායින් බලාපොරොත්තු විය. කෙසේ වුවද, පසුගිය වර්ෂයන්හිදී රාජ්‍ය අංශයේ නිෂ්පාදන ව්‍යවසායයන්හි ලාභදායිත්වයේ සාමාන්‍ය මට්ටමේ පහත වැටීමක් දක්නා ලදී. මෙම ව්‍යවසායයන්හි සමස්ත මූල්‍ය ප්‍රතිඵල 1980 දී රුපියල් දශ ලක්ෂ 679 ක ලාභයක් පෙන්නුම් කළද, ඊළඟ වර්ෂ දෙකේදී සමස්ත අලාභය පිළිවෙළින් 1981 දී රුපියල් දශ ලක්ෂ 241 ක් සහ 1983 දී රුපියල් දශ ලක්ෂ 555 ක් විය. මෙම තත්ත්වය වළක්වාලීමේ පියවරක් වශයෙන් මෑත කාලයේදී මූල්‍යමය ශක්‍යතාවය, නාස්තිය වැළැක්වීම හා නිෂ්පාදන වියදම් අඩු කරගැනීමේ පියවරවල් කෙරේ විශේෂ අවධානයක් යොමු කැරිණ.

## 1·22 සංඛ්‍යා සටහන

## කාර්මික ව්‍යවසායයනට කරන ලද රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1981—1983

(රුපියල් දශ ලක්ෂ)

| සංස්ථාව/ව්‍යවසායය | ප්‍රාග්ධන | | | වර්තන | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1981 | 1982 | 1983 | 1981 | 1982 | 1983 | 1981 | 1982 | 1983 |
| ජාතික කිරි මණ්ඩලය .. .. | 50·5 | 10·7 | 9·0 | 44·3 | 45·9 | 21·3 | 94·8 | 56·6 | 30·3 |
| ලංකා තෙල් සහ මේද .. .. | 34·7 | 10·9 | 25·3 | — | — | — | 34·7 | 10·9 | 25·3 |
| ශ්‍රී ලංකා සීනි .. .. | 46·8 | 75·4 | 122·5 | — | — | — | 46·8 | 75·4 | 122·5 |
| ජාතික පේෂකර්ම .. .. | — | — | 31·5 | — | — | 32·7 | — | — | 64·2 |
| ජාතික කඩදාසි .. .. | 4·8 | — | — | 21·2 | 10·0 | — | 26·0 | 10·0 | — |
| රාජ්‍ය රබර් නිෂ්පාදන .. .. | — | — | — | — | 0·7 | — | — | 0·7 | — |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ .. .. | 7·5 | — | — | — | — | — | 7·5 | — | — |
| රාජ්‍ය පොහොර නිෂ්පාදන .. .. | 88·5 | 300·0 | — | 269·0 | 543·0 | 494·7 | 357·5 | 843·0 | 494·7 |
| ලංකා වානේ .. .. | 7·9 | — | 39·1 | — | — | — | 7·9 | — | 39·1 |
| රාජ්‍ය ලෝහ භාණ්ඩ .. .. | — | — | — | — | — | 0·4 | — | — | 0·4 |
| ජාතික ඇසුරුම් ද්‍රව්‍ය .. .. | — | — | — | 6·0 | 2·5 | 7·7 | 6·0 | 2·5 | 7·7 |
| සීමාසහිත ලංකා ඔක්සිජන් .. .. | 10·0 | — | — | — | 2·6 | 8·6 | 10·0 | 2·6 | 8·6 |
| එකතුව .. .. | 250·7 | 397·0 | 227·4 | 340·5 | 604·7 | 565·4 | 591·2 | 1001·7 | 792·8 |

මූලය: මහ භාණ්ඩාගාරය.

ලැබී ඇති දත්තයනට අනුව ලංකා සම් භාණ්ඩ, රාජ්‍ය පතල් කැනීම් හා ඛනිජ සංවර්ධන, රාජ්‍ය ස්කාගාර, ලංකා පිඟන්, ශ්‍රී ලංකා සිමෙන්ති සහ ජාතික ලුණු යන සංස්ථා 1983 වර්ෂයේදී ලාභාංශ වාර්තා කළේය. පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 615 ක පාඩුව සමහන් කරමින් 1983 වර්ෂයේදී ඛනිජ තෙල් සංස්ථාව රුපියල් දශ ලක්ෂ 907 ක ලාභයක් ඇස්තමේන්තු කර ඇත. රාජ්‍ය ලෝහ භාණ්ඩ සහ ලංකා වානේ යන සංස්ථා අනුක්‍රමික දෙවැනි වසරේද පාඩු දැක්විය.

1983 වර්ෂයේදී රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයනට කරන ලද මුළු සංක්‍රාම ගෙවීම් රුපියල් දශ ලක්ෂ 793 ක් වූ අතර, එය රුපියල් දශ ලක්ෂ 227 ක ප්‍රාග්ධන සංක්‍රාමයන්ගෙන් සහ රුපියල් දශ ලක්ෂ 565 ක වර්තන සංක්‍රාම ගෙවීම් වලින් යුක්ත විය. ශ්‍රී ලංකා සීනි, ජාතික පේෂකර්ම, රාජ්‍ය පොහොර නිෂ්පාදන, ලංකා තෙල් සහ මේද හා ලංකා වානේ යන සංස්ථා හා ජාතික කිරි මණ්ඩලය මෙම සංක්‍රාම ලැබූවන් අතර ප්‍රධාන විය.

**ආයෝජන ප්‍රවර්ධන කලාපය**

මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) විසින් 1983 වර්ෂය තුළදී ව්‍යාපෘති 13 ක් අනුමත කරන ලද අතර, 1983 වර්ෂය අවසාන වන විට අනුමත කර තිබූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 185 ක් විය. මේවායින් ආයතන 99 ක් විවිධ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම සමග ගිවිසුම් වලට එළැඹ ඇත. කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ ආයතන 56 ක් වාණිජමය නිෂ්පාදන කටයුතුවල යෙදී සිටි අතර, ආයතන 10 ක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයෙන් පිටතද නිෂ්පාදන කටයුතුවල යෙදී සිටියහ. වාණිජමය නිෂ්පාදන කටයුතුවල යෙදී සිටි ව්‍යාපෘතීන්ගෙන් 33 ක් මසා නිම කළ ඇඳුම් නිෂ්පාදනයේ නියැලී සිටියේය. 1982 දෙසැම්බර් අග වන විට 22,606 හා සැසඳීමේදී 1983 දෙසැම්බර් අවසානයේදී මහ කොළඹ ආර්ථික කොමිසමෙහි මුළු සේවා නියුතු සංඛ්‍යාව 26,053 ක් විය.

තවමත් ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් මසා නිමකළ ඇඳුම් අංශයට අයත් වුවද රබර් සහ රබර් නිෂ්පාදිත, තේ අසුරණයන්, විදුලි උපකරණ සහ මැණික් කර්මාන්ත හා ස්වර්ණාභරණ යන අංශ කෙරේ විවිධාංගීකරණයක්ද දක්නට ලැබිණි. 1983 වර්ෂයේ දී අනුමත කරන ලද ව්‍යාපෘති දහතුනෙන්, දෙකක් රසායනික අංශයෙහි ද එකක් පේෂකර්මයෙහි ද, ලෝහ භාණ්ඩ අංශයෙහි අටක් සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත හා සකස් කළ ලෝහ භාණ්ඩ අංශයෙහි එක බැගින් ද විය. කෙසේ වුව ද, පසුගිය වසර කීපය තුළ අනුමත කරන ලද සංඛ්‍යාව හා සසඳන විට මෙම වසරේ මුළු අනුමැතියන්හි වර්ධන අනුපාතයේ එක්තරා පහත වැටීමක් පෙනේ.

ආයෝජන ප්‍රවර්ධන කලාපයෙහි තවත් සැළකිය යුතු අංශයක් වූයේ ශ්‍රී ලංකාවේ දෙවැනි ආයෝජන ප්‍රවර්ධන කලාපය වූ බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමයි. මෙයට අක්කර 450 ක භූමි භාගයක් ඇතුළත් වන අතර, කර්මාන්තායතන 20 ක මූලික ඉදිකිරීම් කටයුතු 1983 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී.

පසුගිය වසරට වඩා සියයට 46 ක වැඩිවීමක් පෙන්වමින් 1983 වර්ෂයේ ආයෝජන ප්‍රවර්ධන කලාප ව්‍යවසායයන්හි අපනයන ඉපැයුම් රුපියල් දශ ලක්ෂ 2,419 (විගැහි දශ ලක්ෂ 96) ක් විය. පසුගිය වසර වලදී මෙන්ම 1983 දී ද ඇඳුම් පැළඳුම් හා පාවහන් අංශය අපනයන ඉපැයුම්හි ඉහළම ප්‍රමාණයකට (සියයට 79) වගකී අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 47 ක වැඩිවීමක් පෙන්වයි. මෙම අංශයේ එක් සේවාදායකයකු ගේ අපනයන ඉපැයුම් පසුගිය වසරේ රුපියල් 69,315 හා සැසඳීමේදී, රුපියල් 85,707 ක් විය. රුපියල් දශ ලක්ෂ 107 ක් හෝ සියයට 4 ක අපනයන ඉපැයුමක් දැක්වූ, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත අංශය දෙවැනි ඉහළම කාණ්ඩය විය. අගැයිය හැකි වර්ධනයක් පෙන්වූ අනෙක් නිෂ්පාදන ගණය වූයේ රුපියල් දශ ලක්ෂ 10 සිට රුපියල් දශ ලක්ෂ 41 දක්වා වැඩිවීමක් පෙන්නුම් කළ පාන වර්ග හා දුම්කොළ ය. ස්වර්ණාභරණ, විදුලි හා විද්‍යුත් නිෂ්පාදිත, පාවහන් හා ලෝහ නිෂ්පාදිත අනෙක් අපනයන අයිතමයන් විය.

**1 · 23 සංඛ්‍යා සටහන**

**ආයෝජන ප්‍රවර්ධන කලාපය—සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම්**

| කර්මාන්ත | | 1982 (අ) | | 1983 (ආ) | |
|---|---|---|---|---|---|
| | | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) ගණන | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) ගණන | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ |
| 1. මසා නිමකළ ඇඳුම් සහ පාවහන් | .. | 18,853 | 1,306·8 | 22,389 | 1,918·9 |
| 2. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | .. | 1,094 | 89·9 | 760 | 107·6 |
| 3. විද්‍යුත් හා විදුලි උපකරණ | .. | 304 | 25·2 | 431 | 54·9 |
| 4. වානේ හා සකස් කළ ලෝහ නිෂ්පාදිත සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රවාහන උපකරණ | .. | 129 | 8·5 | 175 | 37·7 |
| 5. ස්වර්ණාභරණ සහ මැණික් කැපීම | .. | 587 | 15·0 | 684 | 18·0 |
| 6. පාන වර්ග සහ දුම්කොළ | .. | 13 | 10·4 | 30 | 41·7 |
| 7. ද්‍රව නිෂ්පාදිත | .. | 113 | 2·7 | 64 | 1·6 |
| 8. ලෝහමය නොවන නිෂ්පාදිත | .. | 72 | 4·7 | 85 | 5·6 |
| 9. කොහු නිෂ්පාදන | .. | 113 | 4·2 | 29 | 9·4 |
| 10. අනෙකුත් | .. | 1,328 | 185·7 | 1,406 | 224·1 |
| එකතුව | .. | 22,606 | 1,653·1 | 26,053 | 2,419·5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : මහ කොළඹ ආර්ථික කොමිසම.

## ආර්ථික හා සමාජ පොදු කාර්‍ය්‍ය පිරිවැය

### බලශක්තිය

ආර්ථික කටයුතු කඩිනම්වීමත්, ආර්ථික යටිතල පහසුකම් සඳහා ඒ අනුසාරයෙන් ඇතිවූ පුළුල් ඉල්ලුමත්, මෑත වර්ෂවලදී බලශක්ති පරිභෝජනයේ පෙර නොවූ විරූ වර්ධනයකට මගපෑදීය. ඉල්ලුම හා සැපයුම අතර වූ අසමතුලිත බව හා එහි ප්‍රතිඵලයක් වශයෙන් සැපයුම මත බලපෑ පීඩනය 1983 දී ද අඛණ්ඩව පැවතිණි. ජාත්‍යන්තර වශයෙන්, පසුගිය දස වසර මුළුල්ලේ මෙරට ගෙවුම් ශේෂය කෙරෙහි බලවත් දුෂ්කරතාවයන් ගෙන ආ ලෝක වෙළෙඳ පොළේ තෙල් මිළ, 1973 න් පසු ප්‍රථම වරට 1983 දී පහත වැටිණි. සැබවින්ම, 1983 දී, හුදෙක් මූර්ත වශයෙන් පමණක් නොව නාමික වශයෙන් ද තෙල් මිළ පහත වැටිණි. එහෙත් පෙර නොවූ විරූ අන්දමට නියඟයෙහි බලපෑමෙන් ජල විදුලිය බල උත්පාදනය තියුණු ලෙස සීමාවීම නිසා මෙම හිතකර ජාත්‍යන්තර වාතාවරණයෙන් සම්පූර්ණ වාසි ලබාගැනීමට ශ්‍රී ලංකාවට නොහැකි විය. මේ නිසා තාප බලාගාර ක්‍රියාත්මක කිරීම සඳහා ආනයනය කළ තෙල් (බැර ඩීසල්) වැඩි වශයෙන් පාවිච්චි කිරීමේ අවශ්‍යතාවය ඇති විය. වර්ෂය තුළදී ලැබුණු අඩු වර්ෂාපතනයේ ප්‍රතිඵලයක් වශයෙන් අඩු ජල මට්ටමක් පැවතීමේ හේතුවෙන්, අළුතින් එක්වූ කැනියොන් ව්‍යාපෘතිය (මෙගවොට් 30) මගින් ඇතිවූ අමතර ජල විදුලි බල ධාරිතාවය සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට ද නොහැකි විය.

බලශක්ති පරිභෝජනය පහත හෙළීමේ පියවරක් වශයෙන් වසරේ අවසාන කාලයේදී දීප ව්‍යාප්තව විදුලිය බලය කපා හැරීම ක්‍රියාත්මක කළ අතර, ආර්ථික ක්‍රියාවලිය කෙරෙහි කෙටි කාලීන බලපෑමක් ඉන් ඇතිවිය. ඊට අමතරව බලශක්තිය සංරක්ෂණයේ ඵලදායී පියවරක් ලෙස ඛනිජ තෙල් මිළ හා විදුලිය බල ගාස්තු සංශෝධනය කිරීම කෙරෙහි ද බලධාරීහු යොමු වූහ.